# කෘෂිකර්ම අමාත්‍යාංශය
## கமத்தொழில் அமைச்சு
## Ministry of Agriculture
# ජාතික පොහොර ලේකම් කාර්යාලය
# தேசிய உரச் செயலகம்
# National Fertilizer Secretariat


මගේ අංකය / எனது இல. / My No. 7/1/3/2/2016 අ.වැ.යෝ.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2016.10. 27

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

**<u>2016/17 මහ කන්නයේ වී ගොවින්ගේ හා 2016 වර්ෂයේ වෙනත් බෝග වගා කරන ගොවීන්ගේ පොහොර මුදල් සහනාධාරය ලබා දීමට අදාළව බැංකු ගිණුම් අංක නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම.</u>**

ගොවීන්ගේ බැංකු ගිණුම් අංකය, ජාතික හැඳුනුම්පත් අංකය, බැංකු ශාඛා අංකය හා ගිණුම් හිමියාගේ නම නිවැරදි බවට FCG 02 පිළියෙළ කළ පසු ප්‍රාදේශීය බැංකු මඟින් එම තොරතුරු නිවැරදි බවට මුද්‍රා තබා සහතික කළ යුතු බව NFS / FCG (3)2016/17 MAHA හා 2016.08.15 දිනැති චක්‍රලේඛනයෙන් උපදෙස් දී ඇත.
එහෙත් ගොවීන් විශාල සංඛ්‍යාවක් ඇති ප්‍රදේශ වල දී එම කටයුත්ත ප්‍රාදේශීය බැංකු ශාඛා මඟින් ඉටු කර ගැනීමට අපහසු අවස්ථාවන් නිරීක්ෂණය වේ.

ඒ අනුව මහජන බැංකුවේ සහකාර සාමාන්‍යාධිකාරී සමඟ අද දින මා විසින් කරන ලද දුරකථන සාකච්ඡාවේ දී එකඟ වූ පරිදි FCG 02 DVD තැටියක් ලබා දී එම බැංකුවේ ප්‍රධාන කාර්යාලය මඟින් පරිගණක අනුසාරයෙන් තහවුරු කර දිය හැකි බවට එකඟ වී තිබේ.

කරුණු එසේ හෙයින් ගොවීන් විශාල සංඛ්‍යාවක් ඇති ප්‍රදේශ වල FCG 02 දත්ත වගකිව යුතු නිලධාරියෙකු මඟින් මහජන බැංකුවේ සහකාර සාමාන්‍යාධිකාරී වෙත ලබා දී බැංකු ගිණුම් අංකය , ශාඛා අංකය හා ජාතික හැඳුනුම්පත් අංකය තහවුරු කර ගැනීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

එසේ කිරීමේ දී තහවුරු නොවන FCG 02 දත්ත පමණක් පසුව නැවත නිවැරදි කර ප්‍රාදේශීය බැංකු ශාඛා මඟින් තහවුරු කර ගැනීමෙන් පසුව ඉදිරි කටයුතු කිරීම වඩාත් පහසු වනු ඇත.

ඉහත උපදෙස් අනුව කටයුතු කරන ලෙස සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් හා ගොවිජන සංවර්ධන නිලධාරීන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වමි.

මේ පිළිබඳව ඔබගෙන් ලැබෙන සහයෝගය අතිශයින්ම අගය කරමි.

එන්.පී.වී.සී.පියතිලක
අතිරේක ලේකම් (මෙහෙයුම් හා ඇගයුම්)
අධ්‍යක්ෂ
ජාතික පොහොර ලේකම් කාර්යාලය
කෘෂිකර්ම අමාත්‍යාංශය

පිටපත්:-

1. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්
2. සහකාර සාමාන්‍යාධිකාරී මහජන බැංකුව } කා.දැ.ස.
3. දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර ගොවිජන සංවර්ධන කොමසාරිස්වරුන්
4. දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ (ජා.පො.ලේ.)
5. සියළුම ගොවිජන සංවර්ධන නිලධාරීන් } කා.දැ.ස.අ.ක.ස.


දුරකථන / தொலைபேசி / Telephone: 011-2885402, 011-2887409, 011-2887449

80/5, "ගොවිජන මන්දිරය", රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.
80/5, "கொவிஜன மந்திரய", ரஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
80/5, "Govijana Mandiraya", Rajamalwatte Avenue, Battaramulla, Sri Lanka

ඊ - මේල් / ஈமெயில் / E- mail: nfssrilanka@yahoo.com
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2887447